// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2355/17 – 2023 ඔක්තෝබර් මස 24 වැනි අඟහරුවාදා – 2023.10.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

*මගේ අංකය*: IR/COM/02/2021/154.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වැනි සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වැනි වගන්තිය යටතේ 2022.11.19 දිනැති හා අංක 2306/87 දරන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2022.11.14 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන්, කොළඹ 12, මිරානියා වීදිය, බී.සී.සී. පරිශ්‍රය, අංක 21, ප්‍රසම්පාදන අංශය, ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව හි ආර්.වයි.ජී.එස්. ගයාන් යාපා මයා සහ කොළඹ 12, මිරානියා වීදිය, බී.සී.සී. පරිශ්‍රය, අංක 21 හි පිහිටි ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A 73/2022 හා 2023.09.06 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 ඔක්තෝබර් මස 10 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණය - කොළඹ.

*නඩු අංකය:* A/73/2022.
*ආරාවුල් අංකය:* IR/COM/02/2021/154.

1. ආර්.වයි.ජී.එස්. ගයාන් යාපා,
ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව,
ප්‍රසම්පාදන අංශය,
අංක 21,
බී.සී.සී. පරිශ්‍රය,
මිරානියා වීදිය,
කොළඹ 12.

*පැමිණිලිකරු*

*එදිරිව :*

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව,
අංක 21, බී.සී.සී. පරිශ්‍රය,
මිරානියා වීදිය,
කොළඹ 12.

*වගඋත්තරකරු*

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුල බේරුම්කරණය කිරීමෙන් නිරවුල් කිරීම සඳහා අමාත්‍යවරයා විසින් පහත සඳහන් යොමු කිරීම 2022.11.14 වැනි දින සිදු කර ඇත.

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය, මනූෂ නානායක්කාර මහතා 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් මා පත් කොට මා වෙත යොමුකර ඇත.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර පවතින කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ, “ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ සේවය කරන ආර්.වයි.ජී.එස්. ගයාන් යාපා මහතාට කළමනාකරණ සේවා චක්‍රලේඛ 02/2016 හි සඳහන් වැටුප් පියවර හිමි ද, හිමි නම් එය ලබා නොදීමෙන් අසාධාරණයක් සිදු ව තිබේද යන්නත් එසේ අසාධාරණයක් සිදු ව තිබේ නම් හිමි විය යුතු සහනයන් කවරේද කවරදා සිටද යන්නත් පිළිබඳව වේ.”

1950 අංක 43 දරන කාර්මික ආරාවුල් පනතේ 39 වන වගන්තිය ප්‍රකාරව අමාත්‍යවරයා විසින් 1959 පෙබරවාරි 25 වන දින පනවන ලද නියෝග අංක 21(1) හා 21(2) අනුව ආරාවුලට හේතු වී ඇති කරුණු පිළිබඳව විස්තර ප්‍රකාශයන් හා ප්‍රති උත්තර ප්‍රකාශයන් දෙපාර්ශ්වයන් වෙතින් කැඳවීමෙන් පසුව දෙපාර්ශ්වය කැඳවා ආරාවුල නිරවුල් කිරීම සඳහා යම් එකඟතාවයක් ඇත් ද යන්න 2022.12.06 වන දින දෙපාර්ශ්වය සමඟ සාකච්ඡා කරන්නට යෙදුනි. ආරාවුල නිරවුල් කර ගැනීම සඳහා දෙපාර්ශ්වයේ එකඟතාවයක් නොවූ බැවින් දෙපාර්ශ්වයේ සාක්ෂි කැඳවා පැමිණිල්ල විභාග කිරීමට තීරණය කරන ලදී.

2023.01.05 වන දිනට පළමු සාක්ෂි විභාගය පැවැත්වීමට නියමිතව තිබූ නමුත් එදින පැමිණිලිකාර පාර්ශ්වය වෙනුවෙන් පැමිණිලිකරු වන ආර්.වයි.ජී.එස්. ගයාන් යාපා මහතා පැමිණ සිටි අතර ඔහු වෙනුවෙන් නීතිඥවරයෙකු හෝ නියෝජිතයෙකු පෙනී නොසිටි බව කියා සිටින ලදී. වග උත්තරකාර දෙවන පාර්ශ්වය වෙනුවෙන් අභ්‍යන්තර විගණක නිලධාරි ආර්.ඒ.ඒ. සංජය මහතා පෙනී සිටි අතර ඔහු වෙනුවෙන් ද නීතිඥවරයෙකු හෝ නියෝජිතයෙකු පෙනී නොසිටි බව කියා සිටී.

ඒ අනුව පළමුවෙන්ම පැමිණිලිකරු වන ආර්.වයි.ජී.එස්. ගයාන් යාපා මහතාගෙන් සාක්ෂි ලබා ගත් අතර වගඋත්තරකාර පාර්ශ්වය විසින් ඔහුගෙන් හරස් ප්‍රශ්න නොඅසන බව දන්වා සිටින ලදී.

වගඋත්තරකාර පාර්ශ්වය විසින් ලේඛන පිටපත් ගොන්නක් සමඟින් වගඋත්තරකාර පාර්ශ්වය වෙනුවෙන් සාක්ෂි ලබාදීමට ඉදිරිපත් වුවද ඔහුගේ සාක්ෂිවලට අදාලව ලේඛන ඉදිරිපත් කිරීමටත් ඉදිරිපත් කරන ලද ලේඛන මඟින් පැහැදිලි කිරීම් කිරීමටත් අපොහොසත් වෙමින් කාලය ගත කිරීමක් පමණක් කරන ලදී.

අනතුරුව දෙපාර්ශ්වයටම අවවාද කරමින් මේ ආකාරයට සාක්ෂි විභාග කිරීමට තමන් සහාය නොදක්වන්නේ නම් ඉදිරිපත් කර ඇති ලිඛිත කරුණු මත පමණක් තීරණයක් ගැනීමට සිදු විය හැකි බැවින් දෙපාර්ශ්වයටම තම සාක්ෂි ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි නීතීඥ සහාය හෝ තමන් වෙනුවෙන් නියෝජිතයෙකුගේ සහාය ලබා ගැනිමට හැකියාව ඇති බව පෙන්වා දුනිමි. එදින සාක්ෂි විභාගය අවසාන කර 2023.01.23 දිනට නැවත විභාගය සඳහා දින නියම කළෙමි.

2023.01.23 වන දින වගඋත්තරකාර පාර්ශ්වය නීතීඥවරියක මඟින් ද පැමිණිලි පාර්ශ්වය නියෝජිතවරයෙකු මඟින් ද පෙනී සිටි. දෙපාර්ශ්වයේ එකඟත්වය මත පෙර දින ලබා දුන් සාක්ෂි නොසලකා නැවත මුල සිට සාක්ෂි විභාගය ආරම්භ කිරීමට එකඟ විය. ඒ අනුව සාක්ෂි විභාගය 2022.12.06 දින සිට 2023.05.06 වන දින දක්වා පවත්වා 2023.06.16 වන දින හෝ එදිනට පෙර ලිඛිත දේශන ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන ලදී.

සාක්ෂි විභාගයේදී පහත සඳහන් පරිදි කරුණු අනාවරණය වු අතර එම කරුණු සලකා බලා තීරණ වලට එළඹීමත් ඒ අනුව ලබා දිය යුතු ප්‍රදානය තීරණය කිරීමත් සිදු විය.

පැමිණිලිකරු 2003.05.01 දින කාර්යාල කාර්ය සහායක ලෙස කොන්ත්‍රාත් පදනම යටතේ රාජ්‍ය වැවිලි සංස්ථාවේ සේවයට බඳවා ගෙන ඇත. 2004.01.01 දින සිට පැමිණිලිකරුගේ තනතුර ලිපිකරුවෙකු ලෙසට උසස් කර ඇත.

6/2006 රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛය අනුව ලිපිකාර සේවය, කළමනාකරණ සහකාර සේවය ලෙස වෙනස් වී ඇත. 2006.01.01 දින සිට කළමනාකරණ සේවා චක්‍ර ලේඛ අංක 30 අනුව අර්ධ රාජ්‍ය ආයතන වල සේවයේ නියුතු සේවකයින්ට හිමි වැටුප් සංශෝධනය විය යුතුව තිබූ බැවින් ආර්7 ලේඛනයේ එනම් ඉහත චක්‍ර ලේඛයට අනුව වැටුප් සංශෝධනය කරන ලද ලේඛනයේ පැමිණිලිකරුට හිමි විය යුතු වැටුප් පරිමාණය 13450-10*145-7*170-12*290-12*345 ලෙසට විය යුතු බව පෙනේ.

ඒ අනුව බලන විට 2015.12.31 දිනට පැමිණිලිකරුගේ වැටුප ලෙස ආර්7 ලේඛනයේ දක්වා ඇති රුපියල් 15920 වැටුප් තලය හා වැටුප් පියවර 16 ලෙස ගණනය කර තිබීම නිවැරදිය.

තවද 2014.07.01 දින සිට වගඋත්තරකාර ආයතනය විසින් පැමිණිලිකරු වැඩ බලන සහකාර කළමනාකරු ලෙස පත්කර ඇත. 2/2016 කළමනාකරණ සේවා චක්‍ර ලේඛය අනුව 2016.01.01 දින සිට පැමිණිලිකරුගේ වැටුප MA 1-2-2016 Grade ii වැටුප් කාණ්ඩයේ අනුරූප වැටුප් පියවර 17හි තබා ඇත. 2016.01.01 දිනට ලැබිය යුතු වැටුප් වර්ධකය සමඟ ලබා දී ඇති වැටුප් පියවර 18 හා වැටුප් තලය රු.19544කි.

2016.11.01 දිනට පැමිණිලිකරුගේ තනතුර ස්ථිර කිරීම නිසා ඊට අදාල වැටුප් කාණ්ඩය වන JM1-1 -2016 Grade II වැටුප් කාණ්ඩයේ අනුරූප වැටුප් පියවර වන පළමු වන පියවර හිමි වන නමුත් පාලනාධිකාරිය විසින් 5 වන වැටුප් පියවරේ පැමිණිලිකරුගේ වැටුප තබා ඇත. ඊට අදාල වැටුප් තලය රු:26712.00කි. මෙසේ පළමුවන පියවරේ නොතබා 5 වන පියවරේ තැබීමට හේතුව පැහැදිලි කිරීමට වගඋත්තරකාර පාර්ශ්වය අසමත් වී ඇත. ඒ අනුව 5 වන පියවරේ පැමිණිලිකරුගේ වැටුප තැබීමට හේතුව සභාපතිවරයා ඇතුලු අධ්‍යක්ෂක මණ්ඩලයට ලබා දී අභිමත බලය නිසා බව වගඋත්තරකාර ආයතනය වෙනුවෙන් මූලික සාක්ෂි ලබා දෙමින් විගණන නිලධාරි ආර්. ඒ. ඒ. සංජය යන අය විසින් අධිකරණයේ ප්‍රශ්න කිරීම් වලදී කරන ලද පැහැදිලි කිරීම අනුව තේරුම් ගත හැකිය.

ප්‍රඃ කළමනාකරණ සහකාර තනතුරේ අවසන් වැටුප කියන්න?

පිඃ රු.15920.00යි.

ප්‍රඃ ඒ අනුව මොහුව උසස් කරලා තියෙන්නේ 2016?

පිඃ 2016 මොහුව සහකාර කළමනාකරු තනතුරේ කන්ෆර්ම් (ස්ථිර) කරනවා. වැටුප රු.21985.00

ප්‍රඃ කළමනාකරණ සහකාර තනතුරේ පහලොස් දහස් ගණනක් නේ?

පිඃ එහෙමයි.

ප්‍රඃ ඒ අනුව ඔබ බලන්න ඕනේ මේ පහලොස් දහස් ගණනට අනුරූප වෙන්නේ කොහොමද කියලා නේද ?

ලේඛනයක් පෙන්වා සිටී.

(MA 1-2-2016 Grade ii වැටුප් කාණ්ඩයට අයත් වැටුප් පරිවර්තන වගුව සහ JM 1-1-2016 Grade ii වැටුප් පරිවර්තනය වගුව පෙන්වා සිටී.)

පි: එහෙමයි.

ප්‍ර: මෙතන ඉඳලා එකක් (එක වැටුප් පියවරක්) දෙන්න පුලුවන්. නමුත් 5 වන එකේ (5 වන වැටුප් පියවරේ) තියලා තිබෙන්නේ. ඒකට හේතුව මොකක්ද?

පි: මොහුව පිහිටුවලා තිබෙනවා මෙම ස්ථානයේ. තවත් වැටුප් වර්ධක 4 ක් සමඟින්. (පස්වන පියවරේ ස්ථාපනය කර තිබෙනවා).

ප්‍ර: ඇයි හේතුව

පි: 4ක් සමඟ තමයි ස්ථාපනය කර තිබෙන්නේ.

ප්‍ර: ඔබ ඒ පරිචයක් විදිහට ආයතන සංග්‍රහය අනුගමනය කළා නම් මෙතනදීත් එය අනුගමනය කරන්න ඕනේ?

පි: වැරදීමක් බව පිළිගන්නවා.

(2023.04.30 දින සාක්ෂි සටහන් පිටු අංක 19,20)

වගඋත්තරකාර පාර්ශ්වය වෙනුවෙන් සාක්ෂි ලබා දුන් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (පාලන සහ මානව සම්පත්) ජේ.එම්.අමාත් මහතා සාක්ෂි දෙමින් මෙසේ වැටුප් පියවර 5ක් ඉදිරියෙන් පැමිණිලිකරු තැබීම පිළිබඳව පිළි ගත නොහැකි හේතු දැක්වීමක යෙදුනි.

ප්‍ර: ඔහු ග්‍රේඩ් ටූ (II ශ්‍රේණිය) සිටියදී ඔහු තබන්නේ 5 වන වැටුප් පියවරේ?

පි: ඉනිෂියල් ස්ටෙප් එක ස්වාමීණි. නමුත් ඊට පස්සේ අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කරනවා වැටුප් පියවර 5 ඉදිරියට තියන්න.

ප්‍ර: මෙතන පළමුවන පියවර ?

පි: එය කළමනාකරණ සහකාර වශයෙන් ඉඳලා සහකාර කළමනාකරුවෙකු ලෙස තිබ්බහම එයාව තියන්නේ රුපියල් 21985.00 ක පොෂිෂන් එකේ.

ප්‍ර: කොහොමද එහෙම කියන්නේ?

පි: කළමනාකාර සහකාරවරයෙකු වශයෙන් ඉන්න කොට මෙයා හිටිය වැටුප් තලය රු.15920.00 කයි.

ප්‍ර: මෙතන පළමුවන පියවර කීයද?

පි: රුපියල් 20525.00යි.

එනම් 2/2016 කළමනාකරණ සේවා චක්‍ර ලේඛයට අනුව වැටුප් පරිවර්තනයේදී 2015.12.31 වන දිනට වැටුප රුපියල් 15920.00ක් ලැබූ අයෙකු 2016.01.01 දිනට තැබිය යුත්තේ MA1-2-2016 Grade ii වැටුප් කාණ්ඩයේ අනුරූප පියවර මත 6 වෙනි පියවරෙහි රු.19544.00ක වැටුප් තලයේය. (2016.01.01 දිනට හිමි වැටුප් වර්ධක සහිතව) ඒ අනුව පැමිණිලිකරුට 2016.01.01 දිනට හිමි වැටුප් පියවර 6 වනු ඇති අතර වැටුප් තලය රු.19544.00කි.

2016.11.01 දින පැමිණිලිකරු සහකාර කළමනාකරුවෙකු ලෙස ස්ථිර පදනම යටතේ උසස්වීමක් ලබා ඇත. එදින සිට ඔහුට හිමි වැටුප් කාණ්ඩය වනුයේ JM1-1-2016 Grade ii වේ. එනම් MA 1-2-2016 Grade ii වැටුප් කාණ්ඩයේ සිට 2016.11.01 දිනට JM1-1-2016 Grade ii වැටුප් කාණ්ඩයට ඔහුගේ වැටුප පරිවර්ථනය විය යුතු වේ.

2016.10.30 වන විට ලබමින් සිටි වැටුප MA1-2-2016 Grade ii වැටුප් කාණ්ඩයේ 6 වන පියවරේ වූ රු.19544.00ක වැටුපකි. 2016.11.01 දිනට සහකාර කළමනාකරු තනතුරට අදාල JM1-1-2016 Grade ii වැටුප් කාණ්ඩයේ පිහිටු විය යුතු වැටුප් පියවර වනුයේ 1 වන වැටුප් පියවර වන අතර වැටුප් තලය රු. 24940.00කි. නමුත් පැමිණිලිකරු තබා ඇත්තේ 5 වන වැටුප් පියවරට අදාල රු.26712.00

වැටුප් තලයේය. එසේ ඉහල වැටුප් පියවරක තැබීමට හේතුව පැහැදිලි කිරීමට වගඋත්තරකාර පාර්ශ්වයේ සාක්ෂිකරු ජේ.එම්. අමාත් මහතා විසින් ගන්නා ලද උත්සාහය පහත සඳහන් හේතු දැක්වීම තුලින් තවදුරටත් අසාර්ථක වී ඇත.

පිඃ මෙතුමා 2004 වර්ෂයේ වැඩ තහනමට ලක් වෙලා තිබෙන කොට මෙතුමා නඩුවක් ගොනු කරනවා. ඒ නඩුවේදී 2007දී මෙයාව බැක් වේජස් එක්ක තියන්නත්, නියමිත වැටුප් වර්ධක දෙන්නත් නියෝග කරනවා. එතන වැටුප් වර්ධක 3ක් මෙතුමාට හිමියි.

ප්‍රඃ කළමනාකරණ සහකාර සේවයේදී?

පිඃ කළමනාකරණ සහකාර සේවයේ යෙදී සිටියදී 2016 වර්ෂයේදී මෙතුමා දේශපාලන පලිගැනීම් වලට ලක්වන්නන්ගේ කමිටුවට යොමු කරනවා. එතනදී දේශපාලන පළිගැනීම් වලට ලක්වූවන්ගේ කමිටුව නිර්දේශ කරනවා කලින් කරපු උසාවි නියෝගයක් සලකා බලලා දේශපාලන හේතූන් මත විවිධ ගැටළුවලට මුහුණ දුන් අයට සහන සැලසීම යටතේ නියෝග ලැබිලා තියෙනවා?

ප්‍රඃ මට පැහැදිලි කරන්න සහකාර කළමනාකරු වෙලා විවිධ හේතූන් නිසා ඔහුගේ වැටුප් වර්ධක කිහිපයක් ලැබෙනවා කියනවානේ, ඒ වැටුප් වර්ධක 5ක් ඉහළින්නේ තියලා තියෙන්නේ, ඒ වැටුප් වර්ධක 5 ලැබුනේ කොහොමද කියලා කියන්න.

පිඃ මෙතුමා උසාවි නියෝගයකින් 2007.01.01 දින මෙයාව ප්‍රතිෂ්ඨාපනය කරනවා.

දෙවන පාර්ශ්වයේ නීතිඥවරිය මැදිහත් වී කරුණු පැහැදිලි කිරීමට උත්සහ ගනී.

නීතිඥවරියඃ ඔව්. ඒ අනුව 2007.01.01 වන දිනට ඔහු ප්‍රතිෂ්ඨාපනය කළ යුතුයි. එතකොට ඔහුට නිතැනින්ම වැටුප් වර්ධක 03 ක් ලැබෙනවා අදාල කාලයට. 2004.06.30 සිට 2007.01.01 දක්වා ඒක ක්‍රියාත්මක වුනේ නැහැ. දේශපාලන පලිගැනීම් කමිටුවේ නිර්දේශ ලැබෙනවා ගරු මැතිතුමනි 2016.05.18. එතකොට එම වැටුප් වර්ධක 3ත් මොහු ලබා ගෙන තිබෙනවා. 2015 දී වැටුප් වර්ධකයක්. ඒ වැටුප් වර්ධකයත් එකතු කරලා මොහු මෙතන තැබිය යුතු වුවත් එම 4 ද එකතු කරලා මොහු රුපියල් 21985.00හි තියලා තිබෙන්නේ. ඒ බව පත්වීම් ලිපියේ සඳහන් කරලා තිබෙනවා.

පත්වීම් ලිපිය (ආර්5) පරීක්ෂා කරන ලද නමුත් එවැන්නක් එහි සඳහන් කර නැති අතර වගඋත්තරකාර පාර්ශ්වය විසින් අසත්‍ය කරුණු ඉදිරිපත් කරන බව පෙනී යයි. මෙම පැමිණිලිකරු ලිපිකරුවෙකු ලෙස සේවය කරමින් සිටියදී 2004.06.30 වන දිනට ඔහුගේ සේවය වගඋත්තරකාර ආයතනය විසින් අවසන් කරනු ලැබ ඇත. පැමිණිලිකරු කම්කරු විනිශ්චය සභාවට අයදුම්පතක් ඉදිරිපත් කර තිබූ අතර කම්කරු විනිශ්චය සභාව විසින් එය විභාග කර බලා පැමිණිලිකරු අවසන් වරට සේවය කරන ලද ස්ථානයේම, වර්තමාන වැටුප් තලයේ වර්තමාන ශ්‍රේණියේ ඉල්ලුම්කරුව නැවත සේවයේ ප්‍රතිෂ්ඨාපනය කළ යුතු බවටත් පසු වේතන ගෙවන ලෙසටත් නැවත සේවයේ පිහිටුවීම 2007.01.01 දින හෝ එදිනට පෙර කරන ලෙසටත් නියෝග කර ඇත. (R36)

ඒ අනුව සේවය අවසන් කරන ලද කාලයට අදාල වැටුප් වර්ධක ද සමඟ වර්තමාන වැටුප් තලයේ එනම් නියෝග ලබා දෙන විට ක්‍රියාත්මක වැටුප් තලයේ පිහිටුවීමට නියෝග කර ඇත. එබැවින් අලුතින් වැටුප් වර්ධක 03 ක් ලබා දෙන ලෙස නියෝගයක් කිරීමට අවශ්‍ය නැත. එවැනි නියෝග කිරීමක් ද කර නැත. එසේ නියෝගයක් කළ ද එය ක්‍රියාත්මක කළ යුත්තේ 2007.01.01 දිනෙන් පසු ඔහු ලබන පළමු වැටුප සමඟින්ය. එසේ නැතිව 2016දී දේශපාලනික කමිටුවක නිර්දේශ මත අධිකරණ නියෝගයක් ක්‍රියාත්මක කිරීමට බලා සිටින්නේ යැයි පැවසීම අධිකරණයට කරනු ලබන අපහාසයක් විය හැකිය. අනෙක් කරුණ නම් පැමිණිලිකරු රැකියාව අහිමිව සිටි අවුරුදු 03 ක වැටුප් වර්ධක ගෙවන්නේ නම් එය ගෙවිය යුත්තේ ඔහු කළමනාකරණ සහකාර සේවයේ (ලිපිකරු සේවයේ) සිටින විට ඊට අදාල වැටුප් පරිමාණය අනුව මිස ඔහු සහකාර කළමනාකරු වෙකු ලෙස උසස් වීමක් ලැබූ පසුව ඊට අදාළ වැටුප් පරිමාණය අනුව නොවිය යුතුය. තවද ඔහු ලද වැටුප් වර්ධක 3ට අමතරව 2015 වසරේ වැටුප් වර්ධකයද සමඟ වැටුප් වර්ධක 4ක් ලබා දුන්නේ යැයි කීම සම්පූර්ණ අසත්‍ය ප්‍රකාශයකි.

එනම් පැමිණිලිකරු 2015.12.31 දින වන විට ලබමින් සිටි වැටුප වනුයේ රු.15920.00කි.එම වැටුපට 2015 වර්ෂයට අදාල වැටුප් වර්ධකය ලැබිය යුතු දිනය වන 2015.01.01 දිනට ගෙවන ලද වැටුප් වර්ධකය ද ඇතුලත් වේ. එසේ හෙයින් 2015 වර්ෂය සඳහා නැවත වැටුප් වර්ධකයක් ලබා දීම අවශ්‍ය නොවේ. ඒ අනුව සිදුව ඇත්තේ පහත සඳහන් පරිදි ක්‍රියා කිරීමක් බව සාක්ෂි මඟින් පැහැදිලි වේ. 2016.11.01 දින පැමිණිලිකරුට සහකාර කළමනාකරුවෙකු ලෙස ස්ථිර පත්වීමක් ලබා දී ඇත. එවිට ඔහුගේ වැටුප් කාණ්ඩය JM1-1 -2016 Grade ii වේ. එනිසා පැමිණිලිකරුගේ 2016.11.01 දිනට වැටුප විය යුත්තේ අදාල වැටුප් කාණ්ඩයේ පළමු පියවරේ වැටුප වන රු.24940.00කි. නමුත් ඔහුගේ වැටුප පිහිටුවා ඇත්තේ 5 වන පියවරේ වැටුප් තලය වන රුපියල් 26712.00ක් නිසා 2016.11.01 දිනට වැටුප රු.26712.00කි. මේ අනුව වගඋත්තරකාර පාර්ශ්වය විසින් සහකාර කළමනාකරු ii ශ්‍රේණියට පැමිණිලිකරු උසස් කිරීමේදී ලබාදී ඇති අමතර වැටුප් පියවර 5 පිළිබඳ වගඋත්තරකාර පාර්ශ්වයේ පැහැදිලි කිරීම් බැහැර කරමින් සභාපතිවරයා ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලයේ අභිමතය පරිදි මෙය ලබා දී ඇති වැටුප් පියවර 5ක් බවත් එසේ නැතිව ඔවුන් විස්තර කරන ආකාරයේ හිඟ වැටුප් වර්ධක ලෙස අධිකරණ නියෝගයක් මත ලබා දුන් දෙයක් නොවන බවටත් තීරණය කරමි.

2016.11.01 දිනට ලබමින් සිටි වැටුප වූ රුපියල් 26712.00ක වැටුප 2017.01.01 දිනට රුපියල් 31439.00ක් ලෙසට JM1-1-2016 Grade ii

වැටුප් කාණ්ඩයට අදාල වැටුප් පරිවර්තන වගුව අනුව (2/2016 කළ.සේ.ච පරිදි) තීරණය වේ. ඒ අනුව 2017.01.01 දින සිට 2017.07.31 දින දක්වාම මාසික වැටුප ලෙස රුපියල් 31439.00ක වැටුපක් පැමිණිලිකරු ලබා ඇත.

අලුතින් පත්වූ සභාපති ඇතුලු අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගන්නා ලද තීරණයක් අනුව ආයතනයේ සියලුම සේවකයින්ට වැටුප් වර්ධක 5ක් බැගින් ලබාදීමට ගන්නා ලද තීරණය අනුව සෑම සේවකයෙකුටම අමතර වැටුප් වර්ධක 5ක් බැගින් 2007.08.01 දින සිට ලබා දී ඇත. ඒ අනුව ඔහුගේ මාසික වැටුප JM1-1-2016 Grade ii කාණ්ඩයේ වැටුප් පරිවර්තන වගුව අනුව රුපියල් 34044ක් විය. වැටුප් පියවර 10හි තබා ඇත.

මේ අනුව තවදුරටත් පැහැදිලි වන්නේ සභාපති ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලයට සුදුසු යයි හැඟෙන අවස්ථාවකදී සේවකයෙකුගේ හෝ සේවක කණ්ඩායමක වැටුප කිසියම් සුදුසු යයි තීරනය කරනු ලබන වැටුප් වර්ධක සංඛ්‍යාවකින් ඉහළ දමා ඔහුගේ හෝ ඔවුන්ගේ වැටුප් පියවර ප්‍රමාණට ඉහළට ගෙන යා හැකි බවයි.

2017.12.08 වන දින පැමිණිලිකාර ආර්.වයි.ජී.එස්. ගයාන් යාපා මහතා විසින් එවකට සිටි සභාපතිවරයා අමතමින් සාමාන්‍යාධිකාරිවරයා ඇතුළු අදාල කළමනාකාරවරුන්ට පිටපත් සහිතව ලිපියක් (R11) යවමින් පහත සඳහන් ඉල්ලීම් දෙක ඉදිරිපත් කර ඇත.

i. තමා හා සමාන තනතුරු ලැබූ වෙනත් සේවකයින් JM1-1-2016 Grade ii වැටුප් කාණ්ඩයේ සිට JM1-1-2016 Grade I වැටුප් කාණ්ඩයට උසස් කර වැටුප් ගෙවන බැවින් තමාද එම වැටුප් කාණ්ඩයට උසස් කර එම වැටුප් කාණ්ඩයේ පිහිටුවා වැටුප් ලබා දෙන ලෙස.

ii. තමා හා සමාන තනතුරු දරමින් සිටි අනෙක් සේවකයින් අතර ඇති වී ඇති වැටුප් විෂමතාවය ඉවත් කිරීමට පියවර ගන්නා ලෙස.

ඊට පිළිතුරු වශයෙන් සභාපතිතුමාගේ අංක : SLSPC/HO/HR හා 2018.01.08 දිනැති සාමාන්‍යාධිකාරිවරයා ඇතුලු අදාළ කළමනාකරුවන්ට පිටපත් සහිතව ආර්.වයි.ජී.එස්. ගයාන් යාපා මහතා අමතා ඇති ලිපියේ (R12) පහත සඳහන් කරුණු 4 පිළිබඳව දැනුවත් කර ඇත.

i. නවක සහකාර කළමනාකරුවන්ගේ වැටුප් තල පිහිටුවා ඇති ආකාරය පරීක්ෂා කර බලන ලද බව
ii. එම පරීක්ෂාවේදී ආර්. වයි. ජී. එස්. ගයාන් මහතාගේ වැටුප හා අනෙකුත් නවක සහකාර කළමනාකරුවන්ගේ වැටුප් අතර විෂමතාවයක් පවතින බව.
iii. එම වැටුප් විෂමතාවය ඉවත් කිරීමට ඉදිරියේදී පියවර ගනු ලබන බව.
iv. ඒ සඳහා 2018 වර්ෂයේදී කළමනාකරණ සේවා චක්‍ර ලේඛ අංක 2/2016 අනුව කිරීමට නියමිත වැටුප් පරිවර්තනය සිදු කරන අවස්ථාවේ පැමිණිලිකරුගේ වැටුප JM1-1-2016 Grade 1 වැටුප් කාණ්ඩයේ පිහිටුවා වැටුප් විෂමතාවය ඉවත් කිරීමට කටයුතු කරන බව.

ඒ අනුව සාමාන්‍යාධිකාරිගේ අංක SLPC/HO/PF/M-160 හා 2018.01.11 දිනැති වැටුප් පරිවර්තන ලිපිය (R14) අනුව පැමිණිලිකරුගේ වැටුප පරිවර්තනය කර උද්ගතව තිබූ වැටුප පරිවර්තනය කර උද්ගතව තිබූ වැටුප් විෂමතාවය ඉවත් කර ඇත. වගඋත්තරකාර ආයතනය වෙනුවෙන් මූලික සාක්ෂි ලබා දුන් විගණන නිලධාරී ආර්. ඒ. ඒ. සංජය මහතා සාක්ෂි ලබා දෙමින් මේ බව සනාථ කර ඇත.

ප්‍ර. R11 ලේඛනය ප්‍රකාරව ඔබ ප්‍රකාශ කර සිටියේ සංස්ථාවේ යාපා මහතා සමඟ සමාන තනතුරක දරන අනෙක් පුද්ගලයින්ගේ ශ්‍රේණිය උසස් කර තිබෙන බැවින් මොහුගේ ශ්‍රේණියද උසස් කරන ලෙසද?

පි. ඔව්.
ප්‍ර. ඒ අනුව වැටුප් විෂමතාවය සංශෝධනය කරන ලෙසද?
පි. ඔව්.
ප්‍ර. ඒ අනුව මෙම R11 දරන ලේඛනය ඉදිරිපත් කරන විට යාපා මහතා තබා ඇති තනතුර අනුව ඔහුගේ ශ්‍රේණිය කුමක්ද?
පි. ඔහු තබා තිබෙන්නේ සහකාර කළමනාකරු ii ශ්‍රේණිය.
ප්‍ර. JM1-1 වැටුප් තලයේ 11 ශ්‍රේණිය කිව්වොත් නිවැරදි ද?
පි. ඔව්.
ප්‍ර. ඔහු ඉල්ලා සිටින්නේ කුමන වැටුප් පියවරක තබන ලෙස ද?
පි. JM1-1 ශ්‍රේණියේ i හි පිහිටුවන ලෙසයි.
ප්‍ර. ඒ අනුව ඔහුගේ වැටුප් විෂමතාවය සංශෝධනය කර ලබා දුන්නාද?
පි. වැටුප් විෂමතාවය සංශෝධනය කර ලබා දුන්නා.

(2023.03.10 වැනි දින සාක්ෂි සටහන් පිටු අංක 26, 27)

වගඋත්තරකාර ආයතනයේ සාමාන්‍යාධිකාරී හේමචන්ද්‍රගේ නිශාන්ත පුෂ්පකුමාර ජිනසේන නැමැති අය විසින් සාක්ෂි දෙමින් ප්‍රකාශ කර ඇත්තේ තමන් මෙම පැමිණිලිකරුගේ පැමිණිල්ල පිළිබඳව හොඳින් දන්නා බවත් R12 ලේඛනය පිළිබඳ අවබෝධයක් තමන්ට ඇති බවත්ය. R12 ලෙස දක්වා ඇත්තේ සභාපතිතුමාගේ අංක : SLSPC/HO/HR හා 2018.01.08 දිනැති එස්. ගයාන් යාපා මහතා අමතා ඇති සාමාන්‍යාධිකාරිවරයා ඇතුලු අදාළ කළමනාකරුවන්ටද පිටපත් සහිතව යවන ලද ලිපියකි. එම ලිපිය අනුව සභාපතිවරයා විසින් පැමිණිලිකරු දරමින් සිටි JM1-1-2016 Grade ii වැටුප් කාණ්ඩයේ සිට JM1-1-2016 Grade 1 වැටුප් කාණ්ඩය දක්වා උසස් කිරීම නිවැරදි බව ප්‍රකාශ කර සිටී. තවද පැමිණිලිකරුට ලබා දී ඇති 18 වන වැටුප් පියවර සහ ඊට අදාළ වැටුප් තලය වන රු. 46067/- නිවැරදිව ලබා දී ඇති බව ප්‍රකාශ කර සිටී.

එයින් අදහස් වන්නේ නිවැරදි වැටුප් තලයේ තබන ලද පැමිණිලිකරුගේ වැටුප කිසියම් හේතුවක් මත පහත දැමීමට ගත් පියවර වැටුප් නිවැරදි කිරීමක් ලෙස හැඳින්වීමට බලධාරීන් තීරණය කර ඇති බවකි.

ප්‍ර. මෙම ලේඛනය (R12) පිළිබඳව ඔබතුමාට අවබෝධයක් තියෙනවා ද?
පි. එහෙමයි.
ප්‍ර. එය කුමක්ද?
පි. සභාපතිතුමා විසින් ගයාන් යාපා මහතාගේ වැටුප් විෂමතාවය සංශෝධනය කිරීම සඳහා ඉදිරිපත් කරන ලද ලිපියක්.
ප්‍ර. එහි සඳහන් වෙනවා JM1-1 ශ්‍රේණිය ii හි සිටි ගයාන් යාපා මහතා එම ශ්‍රේණිය සිට JM1-1 ශ්‍රේණිය i, ශ්‍රේණියේ පිහිටුවීමට කටයුතු කර ඇත කියලා. එය නිවැරදි ද?
පි. එහෙමයි.
ප්‍ර. ඒ අනුව ගයාන් යාපා මහතා කුමන වැටුප් පියවරක තබනවාද කියලා සඳහන් වෙනවාද?
පි. JM1-1 ශ්‍රේණිය i හි පිහිටුවා කටයුතු කරන බව.
ප්‍ර. මෙම ලේඛනයට (R14 වැටුප් පරිවර්තන ලිපිය) අනුව ඔහුගේ වැටුප රු. 46067.00ක් කියලා සඳහන් වෙනවා. එම වැටුප නිවැරදි වැටුප් පියවරක තැබීමක් ලෙසද ඔබ හඳුනා ගන්නේ?
පි. එහෙමයි.

(2023 සාක්ෂි සටහන් පිටු අංක 5,6)

සාමාන්‍යාධිකාරිවරයාගේ මෙම පිළිතුරෙන් පෙනී යන්නේ පැමිණිලිකරුගේ වැටුප් විෂමතාවය නිවැරදි කිරීම සඳහා JM1-1 ශ්‍රේණිය ii හි සිට JM1-1 ශ්‍රේණිය i හි 18 වන වැටුප් පියවරේ තබා ඊට අදාළ වූ රු. 46067.00ක වැටුප් තලයේ තැබීම නිවැරදි බවකි. කෙසේ නමුත් පසුව පාලනාධිකාරිය විසින් පැමිණිලිකරුගේ වැටුප නිවැරදි කිරීමක් ලෙස හඳුන්වමින් ඔහුගේ වැටුප පියවර 6කින් පහත හෙළීමට පියවර ගෙන එය පියවර 12හි තැබීමට තීරණය කර ඇති බවද ඔහු පිළිගනී.

ප්‍ර. රු. 46067.00ක වැටුප තබන ලද වැටුප පියවර පසුව නිවැරදි කිරීමකට ලක්වෙලා තියෙනවාද?
පි. එය පසුව නිවැරදි කරලා තියෙනවා.

(2023.05.03 දින සාක්ෂි සටහන් පිටු අංක 6)

දෙපාර්ශ්වය අතර ඇති වී ඇති ආරවුලට මූලික හේතුව වී ඇත්තේ මෙම වැටුප් අඩුකිරීමේ සිද්ධිය වේ. එබැවින් මෙම වැටුප් අඩුකිරීම සාධාරණ ද නැද්ද යන්න තීරණය කිරීමෙන් ආරවුල නිරවුල් කළ හැකිය.

2017.12.31 දිනට පැමිණිලිකරුට හිමි වැටුප, JM1-1-2016 Grade ii කාණ්ඩයේ වැටුප් පියවර ii ට අදාළ රු. 31439.00 ක වැටුපකි. සහකාර කළමනාකරු ii ශ්‍රේණියට අදාළ JM1-1-2016 Grade ii සිට සහකාර කළමනාකරු i ශ්‍රේණියට උසස්වීමෙන් පසුව 2018.01.01 දිනට පැමිණිලිකරුට හිමි වැටුප JM1-1-2016 Grade i කණ්ඩයේ වැටුප් පියවර 18ට අදාල රු. 46067.00ක වැටුපකි.

සහකාර කළමනාකරු ශ්‍රේණිය 1 දක්වා පැමිණිලිකරු 2018.01.01 දිනැතිව උසස් කිරීමේදී සිදු කරන ලද වැටුප් පරිවර්තනයේදී පැමිණිලිකරුට ලැබිය යුතුව තිබුනේ JM1-1-2016 Grade i වැටුප් කාණ්ඩයේ 12 වන පියවරට අදාල වැටුප වන රු. 40601.00ක වැටුපක් වන නමුත් ලබාදී ඇත්තේ තවත් වැටුප් පියවර 6ක් ඉදිරියට තබා 18 වන වැටුප් පියවරට අදාල වැටුප වූ රු. 46067.00ක වැටුපකි.

මෙලෙස වැටුප් පියවර 6ක් ඉදිරියෙන් තබා ඉහල වැටුප් තලයක පිහිටුවා ඇත්තේ පැමිණිලිකරුගේ වැටුප සම්බන්ධයෙන් ඇති වී ඇති වැටුප් විෂමතාවය ඉවත් කිරීම වෙනුවෙන් බව සභාපතිවරයාගේ R12 ලිපියෙන්ද විගණන නිලධාරී ආර්.ඒ.ඒ. සංජය යන අයගේ සාක්ෂි මගින්ද සාමාන්‍යාධිකාරිවරයා විසින් ලබා දුන් සාක්ෂි මගින් ද පැහැදිලි වේ.

මෙම වැටුප් පරිවර්තනයේදී JM1-1-2016 Grade ii සිට JM1-1-2016 Grade i දක්වා ශ්‍රේණි උසස්වීමක් ලබා දී ඇත්තේ සභාපතිවරයා විසින් පැමිණිලිකරුට ඇතිවී ඇති වැටුප් විෂමතාවය ඉවත් කිරීම වෙනුවෙන් බව ඔහුගේ 2018.01.08 දිනැති ලිපියෙන් (R12) දන්වා

ඇත. තවද JM1-1-2016 Grade i කාණ්ඩයේ මේ වන විට වැටුප් වර්ධක කිහිපයක්ද පැමිණිලිකරු විසින් උපයා ගෙන ඇත. සාක්ෂි විභාගයට පෙර තමන් විසින් මෙම ශ්‍රේණි උසස් කිරීමට එරෙහිවද කරුණු ඉදිරිපත් කර තිබූ නමුත් එම ඉහළ ශ්‍රේණියේ වැටුප් වර්ධක කිහිපයක් උපයා තිබීම සලකා බලා ශ්‍රේණි උසස් කිරීමට එරෙහිව හබ නොකිරීමට වගඋත්තරකාර පාර්ශ්වය විසින් තීරණය කර ඇත. සභාපතිවරයා විසින් ඔහුගේ අංක SLSPC/HO/HD/01 හා 2023.01.03 දිනැති ලිපියේ (140 පිටුව) 12 වන ඡේදයෙන් ශ්‍රේණි උසස් කිරීම පිළිබඳ හබ නොකරන බවට අදහස් ප්‍රකාශ කර ඇත.

නමුත් වැටුප් පියවර 6ක් ඉදිරියෙන් තැබීම සභාපතිවරයා විසින් කර ඇත්තේ පැමිණිලිකරුට උද්ගතව තිබූ වැටුප් විෂමතාවය ඉවත් කිරීම වෙනුවෙන් බවට සභාපතිගේ R12 ලිපියෙන් මනාව පැහැදිලි වේ. නමුත් වගඋත්තරකාර පාර්ශ්වය එම කරුණු අමතක වූවා සේ සලකමින් ඒ වෙනුවෙන් හබ කරයි.

පැමිණිලිකරු 2016.11.01 දින නිවැරදි ලෙස JM1-1-2016 Grade ii වැටුප් කාණ්ඩයේ පිහිටුවන ලද බව වගඋත්තරකාර පාර්ශ්වය විසින් ඉදිරිපත් කර ඇති 2020.08.10 හා 2023.01.03 දිනැති ලිඛිත ප්‍රකාශයන්හි 3 වන ඡේදය මගින් ප්‍රකාශකර ඇත. නමුත් එහිදී ද අමතර වැටුප් පියවර 5ක් ඉදිරියෙන් පැමිණිලිකරුගේ වැටුප තබා ඇති අතර ඊට හේතුව පැහැදිලි කිරීමට වගඋත්තරකාර පාර්ශවය අසමත්ව ඇත.

2018.01.01 දින සිට පැමිණිලිකරු JM1-1-2016 Grade i දක්වා උසස් කිරීම වැරදි බව වගඋත්තරකාර පාර්ශවය විසින් ඉදිරිපත් කරන ලද 2020.08.10, 2020.12.06, 2023.01.03 දිනැති ලිඛිත ප්‍රකාශයන්හි පිළිවෙළින් 7 ඡේදය, 4 ඡේදය සහ 4,7,8 ඡේදවල පැහැදිලිව දක්වා ඇත.

නමුත් එම ශ්‍රේණි උසස්වීම ලබාදීම සභාපතිවරයාගේ R12 ලිපිය අනුව ලබා දී ඇති අතර එසේ ශ්‍රේණි උසස් කිරීම නීති විරෝධී වන බවට පෙන්වා දීමට වගඋත්තරකාර පාර්ශ්වය අසමත් වී ඇත.

2019.08.30 වන දින පැවති කළමනාකරණ රැස්වීමේ සටහනේ (R17) 5 වන ඡේදයේ දක්වා ඇත්තේ උසස්වීම්වලදී සහ ශ්‍රේණි උසස්වීම් වලදී වැරදි ලෙස වැටුප් ස්ථාපනය කිරීම නිසා වැරැද්දක් සිදුවී ඇති බවකි. නමුත් විගණන නිලධාරි ආර්.ජී.ජී. සංජය මහතා සාක්ෂි ලබා දෙමින් කියා සිටින්නේ වැරදි ලෙස ශ්‍රේණි උසස් කිරීම හා වැරදි ලෙස වැටුප් ස්ථාපනය කිරීම යන කරුණු දෙකම නිසා වැරැද්දක් සිදු ව ඇති බවකි.

ප්‍ර. (R17 ලේඛනයේ) 5 වන අංකය යටතේ ගෙන ඇති තීරණයේදී වැරැද්දක් සිදුවී ඇතැයි කියා සිටින වැරැද්ද කුමක්ද කියලා පැහැදිලි කරන්න පුලුවන්ද?

පි. මෙහි වැරැද්ද ලෙස සඳහන් වන්නේ උසස් කිරීමේදී වැරදි වැටුප් ශ්‍රේණියක පිහිටුවීම මත එම වැටුප් පියවරේ වැරැද්දක් සිදුවීමෙන් එහි දී මුදලක් වැඩිපුර ගෙවා ඇති බවට සඳහන් වෙනවා.

(2023.03.20 සාක්ෂි සටහන් පිටු අංක : 7)

2018.01.01 දින පැමිණිලිකරුට JM1-1-2016 Grade i වැටුප් කාණ්ඩය ලබා දෙමින් කරන ලද උසස් කිරීමේදී ආයතන සංග්‍රහය 7 වන පරිච්ඡේදයේ 5.3 වගන්තිය ප්‍රකාරව වැටුප් පරිවර්තනය කරන ලද බවට වගඋත්තරකාර පාර්ශ්වය විසින් කරනු ලබන ප්‍රකාශය නිවැරදි යයි උපකල්පනය කරමින් බැලූ විට පැමිණිලිකරු පිහිටු විය යුතු වැටුප එම වැටුප් කාණ්ඩයේ 12 වන වැටුප් පියවර වේ.

නමුත් තවත් වැඩිපුර පියවර 6ක් ඉදිරියට තබමින් වැටුප් පියවර 18හි පැමිණිලිකරු තබා ඇත. සභාපතිවරයාගේ R12 ලිපිය අනුව මෙම වැඩිපුර ලබා දී ඇති වැටුප් පියවර 6 ලබා දී ඇත්තේ පැමිණිලිකරුට ඇති වී තිබූ වැටුප් විෂමතාවය අවසන් වන පරිදි විය යුතුය.

දැන් සළකා බැලිය යුත්තේ සභාපතිවරයා ඇතුලු අධ්‍යක්ෂ මණ්ඩලයට එවැනි වැඩිපුර වැටුප් වර්ධක ලබාදීමට බලයක් ලබා දී ඇත් ද යන්න වේ. මෙම පැමිණිලිකරු වෙනුවෙන් ඔහු සහකාර කළමනාකරු ලෙස උසස් කරන අවස්ථාවේදී පැමිණිලිකරු තැබිය යුතු වැටුප් පියවර වූ පියවර 1 සිට වැඩිපුර වැටුප් වර්ධක 4ක් සමඟ වැටුප් පියවර 5හි තබා ඇත. තවද 2017.08.01 දින සිට සියලු සේවකයින්ට වැටුප් වර්ධක 5ක් වැඩිපුර ලබා දී ඇත.

ඒ අනුව 2018.01.01 දින ශ්‍රේණි උසස් කිරීමේදී ද පැමිණිලිකරුගේ වැටුප් විෂමතාවය ඉවත් කිරීම වෙනුවෙන් වැඩිපුර වැටුප් පියවර 6ක් ඉදිරියෙන් තබා ඇත. මේ අනුව පෙනී යන්නේ සභාපතිවරයාට සහ අධ්‍යක්ෂ මණ්ඩලයට ඕනෑම සේවකයකුගේ වැටුප්, වැටුප් පියවර කිහිපයකින් ඉහළ දැමීමට බලතල ලැබී ඇති බවකි. වගඋත්තරකාර පාර්ශ්වය වෙනුවෙන් සාක්ෂි දුන් ආර්.ජී.ජී. සංජය මහතාගේ සාක්ෂි මගින්ද ඒ බව තහවුරු වේ.

ප්‍ර. ඒ වගේම සභාපතිට තිබෙන බලතල අනුව යම් කිසි සේවකයකුගේ වැටුප, වැටුප් පියවර කිහිපයකින් වැඩි කිරීමට ඔහුට හැකියාවක් තිබෙනවාද? සේවකයාගේ කාර්ය සාධනය හෝ ඉල්ලීමක් සලකා බලා වැටුප් වර්ධක කිහිපයක් ලබා දෙන්න ආයතනයේ සභාපතිතුමාට බලය තිබෙනවාද? එසේ කර තිබෙනවාද?

පි. එසේ කර තිබෙනවා. නමුත් එසේ කිරීමට බලයක් ඇති බවට මා දැනුවත් නැහැ. හෝ ඊට අදාළ ලේඛනයක් පිළිබඳව මා දැනුවත් නැහැ. වැටුප් වර්ධක ලබා දිය යුත්තේ කෙසේද යන්න ආයතන සංග්‍රහයේ පරිච්ඡේදයක සඳහන් වෙනවා.

ප්‍ර. ඔබේ ආයතනයේ පරිචය ඔබේ ආයතනයේ එවැනි පරිචයක් තිබුනාද?

පි. මා දන්නා තරමින් එසේ සිදු කර තිබෙනවා. නමුත් ඊට අදාළ බලය හෝ රෙගුලාසියක් තිබෙන බවට මා දැනුවත් නැහැ.

ප්‍ර. එසේ නම් මෙම සේවකයා 1 ශ්‍රේණියට උසස් කරනවාත් සමගම මේ කියන සභාපතිගේ කලින් කියන ලද බලතල උපයෝගී කර ගෙන වර්ධක කිහිපයක් ඉදිරියෙන් තිබ්බා කියලා පැවසිය හැකිද? එසේ කිව හැකිද? ආයතන සංග්‍රහය අනුව එක වැටුප් වර්ධකයයි දිය හැක්කේ. සභාපතිතුමාගේ බලතල අනුව වැටුප් වර්ධකය දෙනවාත් එක්කම තවත් වර්ධක කිහිපයක් ඉදිරියෙන් තැබිය හැකියි නේද? මේ කියන ආකාරයට

පි. කළ හැකියි ස්වාමීණි. නමුත් ඔහුගේ වැටුප නිවැරදි කරන බව සඳහන් ලිපියේ සඳහන් වන්නේ ඔහුගේ අදාළ ශ්‍රේණිය නිවැරදි කරන බව තමයි.

(2023.03.10 සාක්ෂි සටහන් පිටු අංක 30,31)

සභාපතිවරයාගේ ලිපියේ (R12හි) සඳහන් වන්නේ ශ්‍රේණිය උසස් කරමින් වැටුප් විෂමතාවය නිවැරදි කිරීමට කටයුතු කරන බවකි. ඒ අනුව සභාපති විසින් ශ්‍රේණිය උසස් කරමින් වැටුප් විෂමතාවය ඉවත් කිරීම සඳහා ඔහුගේ බලතල උපයෝගී කර ගනිමින් පැමිණිලිකරුගේ වැටුප පියවර 6කින් ඉදිරියට තබා ඇති බව පෙනේ.

වගඋත්තරකාර පාර්ශ්වය තර්ක කරනුයේ එසේ වැඩිපුර වැටුප් පියවර 6ක් ඉදිරියෙන් නොතබා පැමිණිලිකරු JM1-1-2016 Grade i හි පළමු වැටුප් පියවරේ තැබීමෙන් එම වැටුප් විෂමතාවය ඉවත් කර ඇති බවයි. නමුත් වගඋත්තරකාර පාර්ශ්වය විසින් කිසිම විටෙක සිදු ව තිබූ වැටුප් විෂමතාවයේ ප්‍රමාණය කොතෙක්ද අමතර වැටුප් වර්ධක කීයක් ලබා දීමෙන් එම වැටුප් විෂමතාවය ඉවත් කිරීම කළ හැකි වන්නේද යන්න පෙන්වා දීමෙන් වැළකී සිටී. ඔවුන් නගන එකම තර්කය වනුයේ JM1-1-2016 Grade ii සිට JM1-1-2016 Grade i දක්වා උසස් කිරීමේදී කළමනාකරණ සේවා චක්‍ර ලේඛ අංක : 2/2016හි දක්වා ඇති වැටුප් පරිවර්තන වගුවට අනුව පැමිණිලිකරු පිහිටුවිය යුතු වැටුප් පියවර විය යුත්තේ 12 වන පියවර බවත් වැටුප් තලය රු. 40661.00 ක් බවත්ය. ආයතන සංග්‍රහයේ 7 වන පරිච්ඡේදයේ 5.3 වගන්තියට එය අනුකූල බවත් කළමණාකරණ සේවා 2/2016 චක්‍ර ලේඛයෙහි 7.1 ඡේදයේ දක්වා ඇති උදාහරණ මගින් මඟ පෙන්වා ඇති ආකාරයට ද ගැලපෙන බවත්ය. ඊට එරෙහිව පැමිණිලිකාර පළමු පාර්ශ්වය විසින් සාර්ථක හබ කිරීමක් නොකරයි. ඒ අනුව වගඋත්තරකාර පාර්ශ්වයේ තර්කය පිළිගැනීමට සිදුවේ.

නමුත් ඇතිව ඇති වැටුප් විෂමතාවය සමනය කිරීමට සභාපතිවරයා ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලයට ලැබී ඇති බලතල ප්‍රකාරව සුදුසු පරිදි වැටුප් වර්ධක කිහිපයක් වැඩිපුර ලබා දිය හැකිය. එසේ ලබා දෙන වැටුප් වර්ධක කුමන අරමුණකින් ලබා දුන්නද සභාපතිවරයා ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලයට ලැබී ඇති බලතල අනුව එසේ ලබා දීම නීත්‍යානුකූල වේ. එබැවින් වගඋත්තරකාර පාර්ශ්වය විසින් පෙන්වා දිය යුතු වන්නේ ඇති වී ඇති වැටුප් විෂමතාවයේ ප්‍රමාණය සංඛ්‍යාත්මක වශයෙන් කොතෙක්ද එම විෂමතාවය ඉවත් කිරීමට අමතර වැටුප් වර්ධක කිසියම් ප්‍රමාණයක් ලබා දීම හෝ නොදීම සඳහා වූ සංඛ්‍යාත්මක පැහැදිලි කිරීමකි. වගඋත්තරකාර පාර්ශ්වය විසින් ඊට කිසිදු උත්සහයක් දරා නැත. ඒ අනුව පෙනී යන්නේ පැමිණිලිකරු අපහසුතාවයට පත් කිරීම සඳහා අදාළ නොවන තර්ක ගොඩ නගමින් වගඋත්තරකාර පාර්ශවය විසින් ක්‍රියාකරන බවකි. මෙම පැමිණිලිකරු සම්බන්ධයෙන් මීට පෙරද 2004.06.30 වන දින සිට 2007.01.01 දින දක්වා දේශපාලන පළිගැනීම් මත ඔහුගේ සේවය අවසන් කර තිබූ බවට කම්කරු විනිශ්චය සභාව විසින් තීරණය කර තිබූ අතර ඊට එරෙහිව වගඋත්තරකාර පාර්ශ්වය විසින් බස්නාහිර පළාත් බඳ මහාධිකරණය වෙත කරන ලද අභියාචනයේදී ද කම්කරු විනිශ්චය සභාවේ තීරණය අනුමත කර ඇත. (R36 සහ R37)

තවද කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 2/2016හි අංක 19,1,19,2,19.3 ඡේදවලින් දක්වා ඇත්තේ කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30 අනුව හඳුන්වා දී ඇති වැටුප් සංශෝධනයන් පදනම් කර ගනිමින් 2/2016 චක්‍රලේඛය මගින් යෝජිත වැටුප් සංශෝධන කළ යුතු බවකි.

කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30 අනුව සේවක කාණ්ඩ අළුතින් ශ්‍රේණි ගත කිරීම කළ යුතුව තිබුනි. ඒ අනුව සේවක සංඛ්‍යා ලේඛනයක් පිළියෙල කිරීම, බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටියක් සැකසීම හා ඒවා කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් අනුමත කරවා ගැනීමත් කළ යුතුව තිබුනි. එමගින් අපේක්ෂා කරනුයේ කාර්යා සාධනය පදනම්කර ගත් උසස්වීම් ක්‍රමයක් ඇති කිරීමත් බඳවාගැනීමේ පටිපාටිය විධිමත් කිරීමත් සුදුසුකම් මත වැටුප් තීරණය කිරීමත්ය.

නමුත් මෙම වගඋත්තරකාර ආයතනය විසින් අනුමත බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටියක් පිළියෙල කර මෙතෙක් ක්‍රියාත්මක කර නැත. කළමනාකරණ සේවා චක්‍ර ලේඛ අංක 30 මගින් නියම කරන ලද පරිදි වූ ලේඛන පිළියෙල කර කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් අනුමත කරවා ගෙන ක්‍රියාත්මක නොකිරීම නිසා සේවකයින්ට මෙවැනි අසාධාරණයන්ට මුහුණපෑමට සිදුවී ඇති බව නිරීක්ෂණය කළෙමි.

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (පාලන හා මානව සම්පත්) විසින් සාක්ෂි ලබාදෙමින් තම ආයතනය තුළ මේ දක්වා බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටියක් (SOR) නිසි පරිදි අනුමත කරවාගෙන ක්‍රියාත්මක නොකාරන බව ප්‍රකාශ කර සිටී.

ප්‍ර. 6/2006 චක්‍ර ලේඛය අනුව බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටියක් සකස් කරන්න කියලා තියෙනවා නේද?

පි. SOR එකක්. (බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටියක්) අපි හදලා තියෙනවා. ඒක අමාත්‍යාංශය එක්ක අවසන් මේකේ තියෙන්නේ. අනිද්දාට අපිට ලබා දී තියෙනවා රැස්වීමක් ඒක ෆයිනලයිස් කරන්න (අවසන් තීරණයකට එන්න)

ප්‍ර. මහත්මයා පිළිගන්නවාද මේ ආයතනය තුළ බඳවා ගැනීමේ පටිපාටියක් තිබිය යුතුයි කියලා.

පි. ඔව්.

ප්‍ර. මේ ආයතනය පිහිටුවලා කොච්චර කල්ද කියලා මේ මහත්තයාට කියන්න පුලුවන්ද?

පි. මගේ දැනුමේ හැටියට 1958 වර්ෂයේ.

ප්‍ර. එතකොට එදා මෙදා තුර ආයතනය තවමත් බඳවා ගැනීමේ පටිපාටියක් හදා ගෙන යමින් සිටින අවස්ථාවකයි ඉන්නේ?

පි. ඒක අපි හදලා අමාත්‍යාංශයට යොමු කළා. නමුත් සංශෝධනය කරමින් පවතිනවා. දැන් අවසන් අදියරේ තමයි පවතින්නේ. නමුත් අපි සියළුම බඳවා ගැනීම් අමාත්‍යාංශයේ අනුමැතිය හරහා රාජ්‍ය ව්‍යවහාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය හරහා තමයි සියලුම බඳවා ගැනීම් අපි සිදු කරලා තිබෙන්නේ.

(2023.05.08 දින සාක්ෂි සටහන් පිටු අංක 18, 19)

තම අදහස් දැක්වීමට පැමිණිලි පාර්ශ්වයට කිසිදු අවස්ථාවක් ලබා නොදී වගඋත්තරකාර පාර්ශ්වය විසින් කළමනාකරණ සේවා චක්‍ර ලේඛ අංක 2/2016හි 21.1 ඡේදයට මුවා වී පැමිණිලිකරු, සහකාර කළමනාකරු i ශ්‍රේණියට උසස් කිරීමේදී ඔහුගේ වැටුප් විෂමතාවය සමනය කිරීම සඳහා ලබා දී ඇති අමතර වැටුප් පියවර 6, 2020.01.01 දිනෙන් පටන් ගෙන 2018.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ඉවත් කිරීමට පියවර ගෙන ඇත. වගඋත්තරකරු මූලික සාක්ෂි ලබාදීමේදී අධිකරණයෙන් කරන ප්‍රශ්න කිරීම් හමුවේ, පැමිණිලිකරුගේ හඬට කන් නොදී ඒකපාර්ශිකව කටයුතු කර ඇති බවට හෙළි වේ.

ප්‍ර. මේ ගයාන් මහතාගේ (පැමිණිලිකරුගේ) වැටුප් නිවැරදි කිරීමට කටයුතු කළාද?

පි. ඔව්.

ප්‍ර. ගයාන් මහතා ඒ වගේම ඉල්ලීමක් කළා ලබමින් සිටි වැටුප අඩු කිරීමට හේතු අහලා. එය ලැබුනාද?

පි. ස්වාමීණි මේ අවස්ථාවේදී ගයාන් මහතාගේ ඉල්ලීම අනුව තමයි වැටුප නිවැරදි කරන්නේ.

ප්‍ර. වැටුප අඩුවෙන්න හේතු අහලා ඉල්ලීමක් කළාද?

පි. ලිපියක් ඉදිරිපත් කලා. එය ඉදිරියේදී අප ඉදිරිපත් කරනවා ස්වාමීණි.

ප්‍ර. එයට මේ දක්වා පිළිතුරක් දුන්නේ නැද්ද?

පි. තවම දන්වා නැත.

(2023.03.10 දින සාක්ෂි සටහන් පිටු අංක 33, 34)

කළමනාකරණ සේවා චක්‍ර ලේඛ අංක : 2/2016හි 21.1 ඡේදයෙන් දක්වා ඇත්තේ චක්‍ර ලේඛය මගින් ලබා දී ඇති උපදෙස් වැරදි ලෙස නිර්වචනය කිරීම හේතුවෙන් හෝ ලියකියවිලිවල වැරදීමක් හේතුවෙන් හෝ ගණනය කිරීමේදී ඇති වන වැරදීමක් හේතුවෙන් හෝ වෙනත් වැරදීමක් හේතුවෙන් හෝ කිසියම් නිලධරයෙකුට වැඩිපුර මුදලක් ගෙවා ඇත්නම් එවැනි වැඩිපුර ගෙවා ඇති මුදල් ආපසු ගෙවීමට එම නිලධරයා බැඳී සිටින බවකි.

එම ඡේදයේ දක්වා ඇති පරිදි කිසිදු වැරදීමක් මෙහිදී සිදු නොවී ඇති බව සාක්ෂි විභාගයේදී අනාවරණය විය. එබැවින් පැමිණිලිකරුගේ ලබමින් සිටි වැටුප අඩු කිරීම අසාධාරණ සහ අයුක්ති සහගත වේ. නීත්‍යානුකූල ද නොවේ. වගඋත්තරකාර ආයතනයේ 2019.08.30 දින පැවැත් වූ කළමනාකරණ රැස්වීමේ වාර්තාවේ 5 වන අංකය යටතේ (R17 ලෙස ඉදිරිපත් කරන ලද ලේඛනය) ගෙන ඇති තීරණය මගින් කියවෙන්නේ ලබා දී ඇති නව ශ්‍රේණියේ වැටුප් පියවර පමණක් වැරදි බවකි. නමුත් වගඋත්තරකාර පාර්ශ්වයේ මූලික සාක්ෂි විභාගයේදී කියා සිටින්නේ වැටුප් පියවර සහ ලබා දී ඇති නව ශ්‍රේණියද වැරදි බවකි. ඒ අනුව පෙනී යන්නේ වගඋත්තරකාර පාර්ශ්වය සිතා මතාම අසත්‍ය කරුණු ඉදිරිපත් කරමින් සාක්ෂි ලබා දෙන බවකි.

ප්‍ර. 5 වන අංකය යටතේ, තීරණයේදී වැරැද්දක් සිදුවී ඇතැයි කියන වැරැද්ද කුමක්ද කියලා පැහැදිලි කරන්න පුලුවන්ද?

පි. මෙහි වැරැද්ද ලෙස සඳහන් වන්නේ උසස් කිරීමේදී වැරදි වැටුප් ශ්‍රේණියක පිහිටුවීම මත එම වැටුප් පියවර වැරැද්දක් සිදු වීමෙන් එහිදී මුදලක් වැඩිපුර ගෙවා ඇති බවට සඳහන් වෙනවා.

(2023.03.20 දින සාක්ෂි සටහන් පිටු අංක : 7)

පැමිණිලිකරු ලබමින් සිටි වැටුප අඩු කිරීමට පාලනාධිකාරිය විසින් ගන්නා ලද තීරණය දේශපාලන පළිගැනීමක් ලෙස වටහා ගැනීමට හැකිවන පරිදි සාක්ෂි ඉදිරිපත් ව ඇත. පැමිණිලිකරුගේ මූලික සාක්ෂි ලබා දීමේදී අධිකරණයෙන් ප්‍රශ්න ඇසීමේදී මෙම තත්වය අනාවරණය විය.

ප්‍ර. සාක්ෂිකරු, ii ශ්‍රේණියේ සිට i ශ්‍රේණියට පත් කරන අවස්ථාවේදී සිටි සභාපතිමද මෙය නිවැරදි කරන්න හදාගන්නේ?

පි. ශ්‍රේණියට පත් කරන අවස්ථවේදී සිටි සභාපතිතුමා වැටුප නිවැරදි කරන අවස්ථාවේදී (සිදු කරන ලද වැටුප් පියවර 6 නැවත අඩු කරන අවස්ථාවේ) සංස්ථාවෙන් ඉවත් ව තියෙනවා ස්වාමීණි.

(2023.03.10 දින සාක්ෂි සටහන් පිටු අංක 35)

2020 ජනවාරි 01 දින සිට වගඋත්තරකාර ආයතනය විසින් පැමිණිලිකරුට 2018.01.01 දින සිට ලබාදී ඇති අමතර වැටුප් පියවර 6 අසාධාරණ ලෙස 2020.01.01 දිනයෙන් පටන් ගෙන 2018.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ඉවත් කිරීම නිසා එම ඉවත් කරන ලද වැටුප් පියවර 6 නැවත 2018.01.01 දින සිට ගණනය කර එදින සිට පැමිණිලිකරුට හිඟ වැටුප් ගෙවීමට ක්‍රියා කිරීම සාධාරණ හා යුක්ති සහගත බවට තීරණය කරමි. තවද 2018.01.01 දිනට නැවත පැමිණිලිකරුගේ වැටුප පෙර පැවති පරිදිම JM1-1-2016 ශ්‍රේණිය i වැටුප් කාණ්ඩයේ 18 වන වැටුප් පියවරේ තැබිය යුතු බවටද තීරණය කරමි.

පැමිණිලිකරුට ගෙවිය යුතු නිසා වැටුප ගණනය කිරීම හා ඒ අනුව මූල්‍ය ප්‍රදානය තීරණ කිරීම.

| කාලය | ලැබිය යුතු මාසික වැටුප | වැටුප් පියවර | මාසික ගැලපුම් දීමනාව | සත්‍ය වශයෙන් ලැබුනු මාසික වැටුප | වැටුප් පියවර | මාසික ගැලපුම් දීමනාව | වෙනස | වැටුප් කාණ්ඩය හා ශ්‍රේණිය |
|---|---|---|---|---|---|---|---|---|
| 2015.01.01 - 2015.12.31 | 15920.00 | 16 | - | 15920.0 | 16 | - | - | MA1-2-2006A |
| 2016.01.01- 2016.10.30 | 19544.00 | 6 | 9764.00 | 19544.00 | 6 | 9764.00 | - | MA1-2-2006 Grade ii |
| 2016.11.01- 2017.01.01 | 26712.00 | 5 | 9670.00 | 26712.00 | 5 | 9670.00 | - | JM1-1-2016 Grade ii |
| 2017.01.01- 2017.07.31 | 31439.00 | 5 | 4943.00 | 31439.00 | 5 | 4943.00 | - | JM1-1-2016 Grade ii |
| 2017.08.01- 2017.11.01 | 34044.00 | 10 | 4528.00 | 34044.00 | 10 | 4528.00 | - | JM1-1-2016 Grade ii |
| 2017.11.01- 2018.01.01 | 34565.00 | 11 | 4445.00 | 34565.00 | 11 | 4445.00 | - | JM1-1-2016 Grade ii |
| 2018.01.01- 2018.11.01 | 46067.00 | 18 | - | 40661.00 | 12 | - | 5406x10 | JM1-1-2016 Grade i |
| 2018.11.01- 2019.01.01 | 46958.00 | 19 | - | 41562.00 | 13 | - | 5406x2 | JM1-1-2016 Grade i |
| 2019.01.01- 2019.11.01 | 53099.00 | 19 | - | 46991.00 | 14 | - | 6108x10 | JM1-1-2016 Grade i |
| 2019.11.01- 2020.01.01 | 54117.00 | 20 | - | 48009.00 | 14 | - | 6108x2 | JM1-1-2016 Grade i |
| 2020.01.01- 2020.11.01 | 60365.00 | 20 | - | 53555.00 | 14 | - | 6810x10 | JM1-1-2016 Grade i |
| 2020.11.01- 2021.01.01 | 61500.00 | 21 | - | 54690.00 | 15 | - | 6810x2 | JM1-1-2016 Grade i |
| 2021.01.01- 2021.11.01 | 61500.00 | 21 | - | 54690.00 | 15 | - | 6810x10 | JM1-1-2016 Grade i |
| 2021.11.01- 2022.01.01 | 62635.00 | 22 | - | 55825.00 | 16 | - | 6810x2 | JM1-1-2016 Grade i |
| 2022.01.01- 2022.11.01 | 62635.00 | 22 | - | 55825.00 | 16 | - | 6810x10 | JM1-1-2016 Grade i |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| 2022.11.01-2023.01.01 | 63770.00 | 23 | - | 56960.00 | 17 | - | 6810x2 | JM1-1-2016 Grade i |
| 2023.01.01-2023.06.01 | 63770.00 | 23 | - | 56960.00 | 17 | - | 6810x10 | JM1-1-2016 Grade i |
| එකතුව | | | | | | | 417378.00 | |

ප්‍රදානය

2018.01.01 දිනට ආර්.වයි.ජී.එස්. ගයාන් යාපා මහතාට ලබාදී ඇති උසස්වීම මත සහකාර කළමණාකරු I ශ්‍රේණියට උසස් කර පත්කිරීම නීත්‍යානුකුල වේ. ඔහුට ලබා දී ඇති වැටුප් කාණ්ඩය JM-1-2016 ශ්‍රේණිය I බවත් ඔහු පිහිටුවා ඇති වැටුප් පියවර 18 බවත් එම වැටුප් පියවරෙහි නීත්‍යානුකුල බවත් තීරණය කරමි. ඒ අනුව අදාළ වැටුප් තලය රුපියල් 46067.00 ක් බැවින්

01. ආර්.වයි.ජී.එස්. ගයාන් යාපා මහතා වැටුප් ලබමින් සිටි වැටුප් කාණ්ඩය වන JM-1-2016 ශ්‍රේණිය i හි 18 වන වැටුප් පියවරේ රුපියල් 46067.00 ක වැටුප් තලයේ නැවතත් 2018.01.01 දිනට තබා 2018.01.01 දින සිට ඉදිරියට වැටුප් වර්ධක ලබාදීම සාමාන්‍ය පරිදි කළ යුතුය. ඒ අනුව 2022.11.01 දිනට JM-1-2016 ශ්‍රේණිය i වැටුප් කාණ්ඩයේ 23 වැටුප් පියවරේ ආර්.වයි.ජී.එස්. ගයාන් යාපා මහතාගේ වැටුප රුපියල් 63770.00ක් (හැටතුන්දහස් හත්සිය හැත්තෑව) ලෙස තබා ඉදිරියට වැටුප් ගෙවිය යුතුය. මෙම නියමයන් මෙය ගැසට් ගත කිරීමෙන් මසක් ඇතුළත ක්‍රියාත්මක කර ඒ බව සහකාර කම්කරු කොමසාරිස් උතුරු කොළඹ වෙත ලිඛිතව දන්වා සිටිය යුතුය.

02. 2020.01.01 දින සිට 2018.01.01 දිනයේ පටන් ක්‍රියාත්මක වන පරිදි වැටුප් අඩු කිරීමක් නොකලේ නම් ආර්.වයි.ජී.එස්. ගයාන් යාපා මහතා විසින් 2018.01.01 දින සිට 2023.06.01 දින දක්වා ලැබූ මුළු වැටුපත් 2020.01.01 දින සිට 2018.01.01 දිනයේ පටන් ක්‍රියාත්මක වන පරිදි වැටුප් අඩු කිරීමෙන් පසුව 2018.01.01 දින සිට 2023.06.01 දක්වා ලැබූ මුළු වැටුපත් අතර වෙනස වූ රුපියල් 417378.00 (හාරලක්ෂ දහත්දහස් තුන්සිය හැත්තෑ අට) ක පමණ මුදලක් මූල්‍ය ප්‍රදානයක් වශයෙන් ආර්.වයි.ජී.එස්. ගයාන් යාපා මහතා වෙත ගෙවීමට හැකිවන පරිදි උතුරු කොළඹ දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ සහකාර කම්කරු කොමසාරිස්වරයා වෙත මෙය ගැසට් ගත කිරීමෙන් මසක් ඇතුළත තැන්පත් කරන ලෙසට වගඋත්තර පාර්ශ්වයට නියෝග කරමි.

මෙය සාධාරණ හා යුක්ති සහගත ප්‍රදානයක් බව තීරණය කරමි.

**එම්.එම්.අයි.ආර්.ඒ. ජයතිලක,**
බේරුම්කරු.

2023 සැප්තැම්බර් මස 06 වැනි දින දී ය.

EOG 10 - 0234

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.